# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,032 - 2017 අගෝස්තු මස 11 වැනි සිකුරාදා - 2017.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1504 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1507 |



*සැ. යු.-* (i) විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2017 ජූලි මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(ii) පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත 2017 ජූලි මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 අගෝස්තු මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අගෝස්තු මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකුලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුව

### අගවිනිසුරු නිල නිවසේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ අරක්කැමි තනතුර සඳහා පහත සුදුසුකම් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

අගවිනිසුරු නිල නිවසේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ අරක්කැමි තනතුර සඳහා විවෘත පදනම මත සුදුස්සන් තෝරා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් 2017.08.25 දින හෝ ඊට පෙර ලැබෙන සේ "රෙජිස්ට්‍රාර්, ශ්‍රේෂ්ඨාධිකරණය, කොළඹ 12." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. එම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III වන ශ්‍රේණියේ අරක්කැමි තනතුර සඳහා බඳවා ගැනීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසු එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :-
ඉදිරියේදී රජය විසින් ගනු ලබන තීරණවලට යටත්ව ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය.

03. *වැටුප් පරිමාණය* :
අංක 03/2016 හා 2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III, II හා I වන ශ්‍රේණිවලට අදළ මාසික වැටුප් පරිමාණය PL 1-2016 - රු. 24,250 - 10x250-10x270-10x300-12x330- රු. 36,410/- ක් වේ. රු. 27,020/-න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස්වීම ද රු. 29,750/- න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස්වීම ද, රු. 32,780/- න් ඔබ්බට යාම සඳහා විශේෂ ශ්‍රේණියට උසස්වීම ද ලබාගත යුතුය.

04. සුදුසුකම් :-

4.1 *අධ්‍යාපන සුදුසුකම්* :-

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයයන් 06 ක් සමත්ව තිබීම.

4.2 *වෘත්තීය සුදුසුකම්* :- විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

4.3 *පළපුරුද්ද* :- විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

05. වයස් සීමාව :-

2017.08.25 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රාජ්‍ය සේවයේ සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

06. වෙනත් සුදුසුකම් :-

*(අ)* ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
*(ආ)* යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු යි.
*(ඇ)* රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්හි V වෙනි පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත්කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතු ය.

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :-
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේ දී ම පැවැත්වෙන වුහගත සම්මුඛ පරීක්ෂණයකදී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල තරයේම අනුග මනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍යය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර, වුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

වුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙන පරිපාටිය පහත වගුවේ පරිදි වේ :-

| *පරීක්ෂාකර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01 අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදළ නොවේ. |
| 02 වෘත්තීය සුදුසුකම් | 20 | |
| 03 භාෂා දැනුම | 10 | |
| 04 පරිගණක දැනුම | 15 | |
| 05 පළපුරුද්ද | 40 | |
| 06 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය පෞරුෂත්වය, සන්නිවේදන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

***සටහන .***- තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතු යි.

08. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව :-

| *භාෂාව* | | *ලබාගත යුතු ප්‍රවීනතාව* |
|---|---|---|
| 01 | රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු සේවකයින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |
| 02 | අනෙකුත් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදළ වන මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

09. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනීගියහොත් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

10. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

11. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ අරක්කැමි තනතුර සඳහා බඳවා ගැනීම" යන්න සඳහන් කරන්න.

12. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

I පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
II වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සඳහාවන බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදළ වේ.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

රෙජිස්ට්‍රාර් - ශ්‍රේෂ්ඨාධිකරණය.

2017 අගෝස්තු මස 01 වැනි දින,
ශ්‍රේෂ්ඨාධිකරණ කාර්යාලයේ දී ය.

## ආදර්ශ අයදුම්පත්‍රය

*ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියට බඳවා ගැනීම*

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

අයදුම්කරන භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 [ ]

සේවය කිරීමට මනාපය දක්වන අමාත්‍යාංශය :————.
දෙපාර්තමේන්තුව :————.
අයදුම්කරන තනතුර :————.

1. මුලකුරු සමග නම :————.

2. සම්පූර්ණ නම :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]

4. ස්ථිර ලිපිනය :————.

5. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0 [ ]

6. උපන් දිනය : වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

7. දුරකථන අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

8. අධ්‍යාපන සුදුසුකම් :

I අ. පො. ස. (සා. පෙළ) පළමුවර ප්‍රතිඵල : වර්ෂය :————. මාසය :————.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

II අ. පො. ස. (සා. පෙළ) දෙවනවර ප්‍රතිඵල : වර්ෂය :————. මාසය :————.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.1 *අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර* :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

(iii) ප්‍රතිඵල :————.

| *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

9. වෙනත් සුදුසුකම් :————.

10. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද :————.

11. ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම් :————.

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? :————.
(අදාළ කොටුවේ ✓ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් [ ] නැත [ ]

13. අයදුම්කරුගේ සහතිකය :

(*අ*) මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(*ආ*) ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(*ඇ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

08-621

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(2017)

## Second Efficiency Bar Examination for Grade 1 Statistical Officers in the Department of Census and Statistics - 2013 (2017)

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවාගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2017 නොවැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. *විභාග ගාස්තු* : විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම වාර දෙකක දී හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයකට හෝ පළමුවරට පෙනී සිටින අපේක්ෂකයින්ගේ ගාස්තු අය නොකෙරේ. ඉන්පසු පෙනී සිටින ඕනෑම වාරයක දී එක් විෂයක් සඳහා රු.250 ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු.500 විභාග ගාස්තුවක් ද අයකෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතු ය. මෙම විභාග ගාස්තුවට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. *අයදුම්පත්‍ර* : අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. මෙම ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙළ කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිළිව අයදුම්රුගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2017 සැප්තැම්බර් 11 දිනට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා බාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය: අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් කුමක් වුව ද, භාරගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශීය ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියකියවිල්ලක් ඉදිරිපත් කල නොහැකි අයදුම්කරුගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

06. අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවෙකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතු ය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ

පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීමද ප්‍රතිඵලදායී වනු ඇත.

06.1 විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳ සලකනු නොලැබේ.

06.2 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන් ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතු ය. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍ය ලෙස, තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයෙකු නම්, තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යද තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයෙකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලුම විෂයන් සඳහා එකම භාෂා මාධ්‍යකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත් වේ.

10. *විභාග පටිපාටිය*

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

| | *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 1. | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 2 | 100 | 40% |
| 2. | මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40% |

| | *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 1 | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | මේ සඳහා ආයතන සංග්‍රහයේ XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII යන පරිච්ඡේද සහ එම පරිච්ඡෙද සංශෝධනය කරන ලද චක්‍රලේඛ පිළිබඳව ද අවධානයට ගතයුතු වේ. |
| 2 | මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ. :<br>➢ VI වන පරිච්ඡෙදය - ආණ්ඩුවේ මුදල් යනාදිය භාරකාරීත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම් රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව, බැංකු ගිණුම් (මු.රෙ. 315 සිට 396 දක්වා)<br>➢ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය 2006 - භාණ්ඩ හා වැඩ යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය. |

*සටහන* :

➢ ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකි ය.

➢ නියමිත කාලය තුළදී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසු යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

11. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

12. මෙම *ගැසට්* නිවේදනය මගින් විධිවිධාන සලකා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත් වේ.

ආචාර්ය ඒ. ජේ. සතරසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන
දෙපාර්තමේන්තුව,
අංක 306/71,
සංඛ්‍යාන මන්දිරය,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(2017)**

Second Efficiency Bar Examination for Grade 1 Statistical Officers in the Department of Census and Statistics - 2013 (2017)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා* : HEARTH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා :- GUNAWARDHANA, H.M.S.K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)
2.2 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 පෞද්ගලික ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 දුරකථන අංකය :

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. ස්ත්‍රී/ පුරුෂ භාවය
පුරුෂ - 0
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂයය/ විෂයයන්

| අනු. අංකය | විෂයය | විෂය අංකය |
|---|---|---|
| 01. | | |
| 02. | | |

06. උපන් දිනය :

වර්ෂය මාසය දිනය

07. දැනට දරන තනතුර :
7.1 තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.

08. 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වාතාවට ද? :————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 ලදුපත් අංකය :————.
8.4 දිනය :————.

ලදුපත මෙහි අලවන්න. (අදාළ නම් පමණි).
(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

09. *අයදුම්කරුගේ ප්‍රකාශය* :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග

ගාස්තුව රුපියල් …………… ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වන බව ද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන* - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළයුතු ය.

10. අත්සන සහතික කිරීම :
මගේ දෙපාර්තමේන්තු නිලධාරියකු / නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ……………… ………………………… මයා/ මිය/ මෙනවිය …………………….. දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබා ගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිලමුද්‍රාවෙන් සනාථ කරන්න)

11. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිලමුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

08- 360/1

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(2017)

## 1st Efficiency Bar Examination for Grade II Statistical Officers in the Department of Census and Statistics - 2013 (2017)

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2017 නොවැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. *විභාග ගාස්තු.*- විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ ඉන් කොටසකට හෝ පළමුවරට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන්පසු පෙනී සිටින ඕනෑම වාරයක දී එක් විෂයක් සඳහා රු.250 ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු.500 විභාග ගාස්තුවක් ද අයකෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතු ය. මෙම විභාග ගාස්තුවට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. (විභාග ගාස්තු ගෙවා ලබාගන්න ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. *අයදුම්පත්‍රය.*-අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. මෙම ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට

05 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙළ කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිළිව අයදුම්කරුගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2017 සැප්තැම්බර් 11 දිනට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ.1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා බාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තවද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය.*-අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් කුමක් වුවද, භාරගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේතුවේ කොමසාරිස් විසින් නිකුත්කරන ලද ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශීය ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියකියවිල්ලක් ඉදිරිපත්කළ නොහැකි අයදුම්කරුගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

06. අයදුම්පත් යොමුකර ඇති අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවෙකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතු ය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියා පදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම ද ප්‍රතිඵලදායී වනු ඇත.

06.1 විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳ සලකනු නොලැබේ.

06.2 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. අයදුම්කරුවන් ප්‍රවේශ පත්‍රයේ තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා හෝ සහතික කරවා ගත යුතු ය.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත්කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පමණක් පැවැත්වේ. අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍ය ලෙස, තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයෙකු නම්, තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයෙකු නම් රාජ්‍ය සේවයට ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලුම විෂයන් සඳහා එකම භාෂා මාධ්‍යකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත් වේ.

10. විභාග පටිපාටිය.

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1. | මූලික සංඛ්‍යාන ක්‍රම | පැය 2 | 100 | 40% |
| 2. | කාර්යාල පාරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 2 | 100 | 40% |
| 3. | මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40% |

| ප්‍රශ්න පත්‍රය | | විෂය නිර්දේශය |
|---|---|---|
| 1 | මූලික සංඛ්‍යාන ක්‍රම | දත්ත එක්රැස් කිරීම හා ඉදිරිපත් කිරීම, t ව්‍යාප්ති, ප්‍රථම ව්‍යාප්ති, t කල්පිත පරීක්ෂා මූලධර්ම හා $x^2$ පරීක්ෂා, ජාල රේඛය හා සංඛ්‍යාත වක්‍ර කේන්ද්‍රියක ප්‍රවණතාවය හා අපකිරණයේ මිනුම් (මාතය, මධ්‍යස්ථය, මධ්‍යන විචලතාවය, චතුර්ථක හා සම්මත අපගමනය, නියැදුම්වාදයේ මූලධර්ම, නියැදුම් සමීක්ෂණය, නියැදුම් දෝෂය, හා නොනියැදුම් දෝෂය, දර්ශක අංක, සරල සහසම්බන්ධතාවය, රේඛීය ප්‍රතිපායනය සහ සංඛ්‍යාන විද්‍යා මූලික දැනුම). |
| 2. | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | ➢ මේ සඳහා ආයතන සංග්‍රහයේ II, III, IV, V, VIII, XII, XIII, XIV, XIX යන පරිච්ඡේද සහ එම පරිච්ඡේද සංශෝධනය කරන ලද චක්‍රලේඛ පිළිබඳව ද අවධානය ගතයුතු වේ. |
| 3. | මුදල් රෙගුලාසි | මෙය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>➢ I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු, ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම (මු.රෙ. 1 සිට 68 දක්වා)<br>➢ III වන පරිච්ඡේදය - මුල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව, ප්‍රධාන ගණක නිලධාරීන්, ගණක නිලධාරීන්, ආදායම් ගිණුම් නිලධාරීන් ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මු.රෙ. 124 සිට 147 දක්වා) |

*සටහන* -

➢ ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකි ය.

➢ නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසු යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

11. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත්කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

12. මෙම *ගැසට් නිවේදනය* මගින් විධිවිධාන සලකා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත් වේ.

ආචාර්ය ඒ. ජේ. සතරසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන
දෙපාර්තමේන්තුව,
අංක 306/71,
සංඛ්‍යාන මන්දිරය,
පොල්දූව පර,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(2017)

First Efficiency Bar Examination for Grade II Statistical Officers in the Department of Census and Statistics - 2013 (2017)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා :- GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම සහ ලිපිනය :————.
(සිංහලේ/දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 දුරකථන අංකය : | | | | | | | | | | |

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. ස්ත්‍රී/ පුරුෂභාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත්වන විෂයය/ විෂයයන් :

| *අනු. අංකය* | *විෂයය* | *විෂය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |

06. උපන් දිනය :

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

07. දැනට දරන තනතුර :
7.1 තනතුර :————.

7.2 පත්වීම් ලිපියේ අංකය :————.

08. 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 ලදුපත් අංකය :————.
8.4 දිනය :————.

ලදුපත මෙහි අලවන්න. (අදාල නම් පමණි).
(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

09. *අයදුම්කරුගේ ප්‍රකාශය* :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල් .............. ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන* - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළයුතු ය.

10. *අත්සන සහතික කිරීම* :
මගේ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු / නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන............ ............................ මයා/ මිය/ මෙනවිය .......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිලමුද්‍රාවෙන් සනාථ කරන්න)

11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :
1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිලමුද්‍රාව

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

08- 360/2

## සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

### සිසු හෙද පුහුණුවට බඳවාගැනීම - 2017 වර්ෂය

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීමට අංක 1837/8 හා 2013.11.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාවට හා ඊට වරින්වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පිරිමි අයදුම්කරුවන් බඳවාගැනීම හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අවශ්‍යතා පදනම්කර ගනිමින් සිදුකරනු ලැබේ.)

*සටහන* .-2016 වර්ෂයට අදාළව සිසු හෙද පුහුණුවට අයදුම්කර මේ වන විට www.health.gov.lk වෙබ් අඩවියේ තෝරාගත් ලෙස නම සඳහන්වන සිසුන් මෙම චක්‍රලේඛය යටතේ නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවන බව සැලකිය යුතුය.

01. මෙහි දී දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

ඉන් පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් අයදුම් කර සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

ඉන්පසු එම එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම වර්ෂයේ ජෛවීය විද්‍යා විෂය ධාරාව හා භෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ අයදුම්කර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂවලට අදාලව එක් එක් විෂයධාරා යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

එලෙස එක් එක් වර්ෂයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් 5% පිරිමි අයදුම්කරුවන්ගෙන් ද 95% ගැහැණු අයදුම්කරුවන්ගෙන් ද සමන්විත වන ලෙස එක් එක් වර්ෂයන් හි එක් එක් විෂයධාරා යටතේ දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතුරින් පුහුණුවට බඳවා ගනු ලැබේ.

02. මෙම පාඨමාලාවන් පූර්ණ කාලීන පාඨමාලාවන් වේ. එබැවින් සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන ආයතනයක හෝ පූර්ණ කාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතු ය. යමෙකු එසේ අයදුම්කර පසු අවස්ථාවක දී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/ තනතුරෙන් ඉවත්කර ඒ වන තෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරන ලද සියලුම වියදම් අයකර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරන අයකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම් ඔවුන් පහත දැක්වෙන ආකාරයට ක්‍රියාකළ යුතු ය.

2.1 2017.08.31 වැනි දින වන විට ඔබ කුමන හෝ විශ්ව විද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ පූර්ණ කාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි ව සිටියේ නම් හෝ සිටින්නේ නම් සිසු හෙද පුහුණුව සඳහා තේරී පත්වුවහොත් හෙද පුහුණුව සඳහා හෙද විද්‍යාලේ ලියාපදිංචි කරන දිනට පෙර අදාළ පුහුණුවෙහි හෝ පාඨමාලාවෙහි ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය.

2.2 2017.08.31 දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන පාඨමාලාවක හෝ ලියාපදිංචි වී නොසිටි අයෙක් වුව ද යම් හෙයකින් සිසුහෙද පුහුණුවට අභ්‍යාසලාභීන් ලියාපදිංචි කරන දින වන විට ලියාපදිංචිව සිටියේ නම් ඔහු ද සිසු හෙද පුහුණුවේ ලියාපදිංචිය ලබා ගැනීමට පෙර එම පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය.

2.3 සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයදුම්කරුවන් වේ නම් ඔවුන් සිසු හෙද පුහුණුවට තේරී පත්වුවහොත් ඒ වනවිට ලබමින් සිටි පුහුණුවට අදාළව අත්සන් කර තිබෙන ගිවිසුම්වලට අනුව ගිවිසුම් ගත මුදල හා ඒ වනවිට ලබා ඇති සියලු දීමනාවන් ගෙවා අදාළ පුහුණුවෙන් ඉවත් වුවහොත් පමණක් සිසු හෙද පුහුණුව සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

***සැලකිය යුතුය*** :

1. ඉහත 2.1 සිට 2.3 දක්වා සඳහන් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පුහුණුව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

2. එමෙන්ම ඔබ ප්‍රමාණවත් Z අගයක් ලබා මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද 2.1 සිට 2.3 දක්වා සඳහන් කොන්දේසි සපුරා නොමැති නම් කිසිදු අයුරකින් මෙම පුහුණුව සඳහා ලියාපදිංචි කරනු නොලැබේ.

03. *අධ්‍යාපන සුදුසුකම්* :

(*අ*) 2015 හා 2016 වර්ෂයන්හි කුමන හෝ වර්ෂයක, අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ජෛවීය විද්‍යා විෂයය ධාරාවට අයත්, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03ක් හදාරා සියලුම විෂයයන්ගෙන් එකවර සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර);

*හෝ*

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යා විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, හා උසස් ගණිතය යන විෂයයන් අතුරින් විෂයන් 03ක් හදාරා සියලුම විෂයයන්ගෙන් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)

*සහ*

(*ආ*) සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 04ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

04. *අනෙකුත් සුදුසුකම්* :

(*අ*) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය;

(*ආ*) 2017.08.31 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 28ට නොවැඩි විය යුතු ය;

(*ඇ*) උස අඩි 04 අඟල් 10 (147.3 cm) ට නොඅඩු විය යුතු ය.

(*ඈ*) අවිවාහක විය යුතු ය.

(*ඉ*) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෙද නිලධාරියෙකු ලෙස සේවය ලබාදීම සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍යය විය යුතු ය.

(*ඊ*) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(*උ*) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(*ඌ*) ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකිය.

(*එ*) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2017.08.31 වැනි දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය. පදිංචිය සනාථ කිරීමට පහත කරුණුවලින් එකක් සපුරා තිබිය යුතු අතර, අදාළ ලිපි ලේඛන සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ ඉදිරිපත් කළ යුතු ය. :

(i) 2017.08.31 වැනි දිනට පූර්වාසන්න වසර 03ක් තුළ ඔහු එම දිස්ත්‍රික්කය තුළ අඛණ්ඩව පදිංචි වී සිටිය යුතු ය. (මෙහිදී ප්‍රාදේශීය ලේකම් අනුඅත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ යුතු ය).

(ii) දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ලබාගත් පූර්වාසන්න වසර 03ක ඡන්දහිමි නාම ලේඛනවල උපුටන ඉදිරිපත් කළ යුතු ය.

05. *අයදුම් කළ යුතු ක්‍රමය* :

(*අ*) මෙම නිවේදනය අග දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත් සකස් කළ යුතු වේ.

ආදර්ශ අයදුම්පතේ දක්වා ඇති අංක 01 සිට අංක 09 දක්වා වගන්ති 01 පිටුවේ ද, අංක 10 වගන්තිය 02 වැනි පිටුවේ ද, අංක 11 සිට අංක 13 දක්වා වගන්ති 03 වැනි පිටුවේ ද වන පරිදි අයදුම්පත් සකස් කළ යුතු වේ. තව ද අයදුම්පතේ ඉහළ දකුණු කෙළවරේ කොටුවේ අදාළ තොරතුරු අනිවාර්යයෙන්ම ඇතුළත් කළ යුතු ය.

*සටහන* :- ඉහත (3) හා (4) යටතේ දැක්වෙන සුදුසුකම් හා අනෙකුත් සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2017.08.31 වැනි දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(*ආ*) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් කවරයකට බහා එම කවරයේ ඉහළ වම් කෙළවරේ අනිවාර්යයෙන්ම "සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2017" ලෙස හා පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කොට 2017.08.31 වැනි දිනට පෙර "අධ්‍යක්ෂ (පාලන) 01, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(*ඇ*) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/ රජයේ ගණකාධිකාරි සේවයේ/රජයේ විද්‍යාලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වාර්ෂිකව රු. 2,40,360 ට නොඅඩු ආරම්භක වැටුපක් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතු වේ.

(*ඈ*) අයදුම්කරුවන් රු. 300ක මුදලක් ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විභාග ගාස්තු රැස්කිරීම ගිණුමට බැරකර අදාළ ලදුපත් අයදුම්පතෙහි කොටුව තුළ ඇලවිය යුතු ය. එම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

06. අසම්පූර්ණ, ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති, බැංකු ලදුපත අලවා නොමැති හා 2017.08.31 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලද බව ද දන්වා එවනු නොලැබේ.

07. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් හෙද ව්‍යවස්ථාවේ හා මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

*සටහන* :-

(*අ*) හෙද විදුහල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවා ගතයුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව පිළිබඳව

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.

(ආ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු වගන්ති කිසිවකින් අදහස් නොවන අතර, එසේ තේරුම් ගත යුතු ද නොවේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ, නුසුදුසු වූ හා තෝරා නොගන්නා අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ පළකරනු ලබන අතර, කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

08. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් හා එම ලේඛනවල තමා විසින් සත්‍ය බවට සහතික කරන ලද පිටපත් ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු ලේඛනයක් භාරගනු නොලැබේ.

(අ) උප්පැන්න සහතිකය;

(ආ) අ. පො. ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකය;

(ඇ) අ. පො. ස. (සා/පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකය;

(ඈ) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියැදුරු බලපත්‍රය;

(ඉ) ඉහත 4 (එ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන;

(ඊ) අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක්.

*සටහන* :- ඉහත අ, ආ, ඇ, ඈ යටතේ දැක්වෙන සහතිකවල සත්‍ය බවට තමා විසින් සහතික කරන ලද පිටපත් අයදුම්පත සමග ද එවිය යුතු ය.

09. *පුහුණු කිරීමේ පරිපාටිය* :

(අ) තෝරාගත් අයදුම්කරුවන් සිසු හෙද/හෙදියන් වශයෙන් හෙද පුහුණු පාසැල්වලට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් විසින් අවුරුදු 03 ක පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරිය යුතු වේ.

(ආ) පුහුණුව සඳහා ලියාපදිංචි වන අභ්‍යාසලාභීන් හෙද පුහුණු පාසැල්වල බලපැවැත්වෙන නීතිරීති මාලාවට යටත් වේ. මෙම නීතිරීතිවලට හා කලින් කල පනවනු ලබන වෙනත් නීතිරීතිවලට ද ඔවුන් යටත් වනු ඇත.

(ඇ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන හෝ පුහුණුවට බඳවා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට හෙළිවුවහොත් හෝ අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය. පුහුණු කාලය තුළ දී අභ්‍යාසලාභීන් කිසිම ආකාරයක නිවාඩුවකට හිමිකම් නොලබන අතර, පුහුණුව සඳහා නොපැමිණෙන දින වෙනුවෙන් දීමනාවෙන් සමානුපාතික මුදලක් අඩු කරනු ලැබේ. කෙසේ වෙතත් විභාගයට පෙනී සිටීම සඳහා සෑම වර්ෂයකම 80%ක පැමිණීම අනිවාර්ය වේ.

(ඈ) හෙද විද්‍යාලක පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 විධිවිධානවලට අනුකූලව සිසු හෙද/හෙදියන්ට ලබාදෙන මාසික දීමනාව ලබා දෙනු ඇත.

(ඉ) පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත්වුවහොත් හෝ ඉවත්කළහොත් හෝ පුහුණුව හැර ගියහොත් ගිවිසුම්ගත මුදල පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනා හා රජය විසින් පුහුණුව සඳහා දරන ලද වියදම් සඳහා වැය වූ මුදල ඔහු හෝ ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. එසේ නොවුවහොත් එම මුදල අයකර ගැනීමට නිසි පියවර ගනු ඇත.

10. විවාහ නොවීමේ කොන්දේසි හා ගිවිසුම :

(අ) සියලුම අයදුම්කරුවන් ඉල්ලුම්පත්‍ර එවන දිනය වන විට අවිවාහකව සිටිය යුතු අතර, පුහුණුව ලබන කාලය තුළ දී ද අවිවාහකව සිටීම අනිවාර්ය වේ. අවිවාහක බව සනාථ කිරීම සඳහා සියලුම අයදුම්කරුවන් විසින් සාමදාන විනිශ්චයකාරවරයෙකු ඉදිරියේ දී අත්සන් තබන ලද දිවුරුම් ප්‍රකාශයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු වේ.

(ආ) සිසු හෙද/හෙදියන් හෙද පුහුණු පාසලට ඇතුළත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව පත්වීමක් ලබාදෙනු ලැබුවහොත් අවම වශයෙන් අවුරුදු 10ක කාල පරිච්ඡේදයක් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හෝ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයක් යටතේ ඇති රෝහලක සේවය කරන බවටත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ඇපකරයකට හා ගිවිසුමකට එළඹිය යුතු ය. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම කාල පරිච්ඡේදය කලින් කලට නිශ්චය කරනු ඇත.

11. සේවා කොන්දේසි :

(අ) සියලුම අභ්‍යාසලාභීන් පුහුණුව ආරම්භ කිරීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීම අවශ්‍ය වේ.

(ආ) පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. තුන් අවුරුදු පුහුණුව සාර්ථකව නිමකර අවසන් විභාගයෙන් සමත්වන සිසු හෙද/හෙදි අභ්‍යාසලාභීන් සඳහා ස්ථිර පත්වීම් ලබා දීමට රජය අපේක්ෂා කළහොත් ඔවුන් 2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධානවලට අනුව MT-07-2016 වැටුප් පරිමාණය මත III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරුවල පවත්නා පුරප්පාඩු සඳහා පත්කරනු ලැබේ.

(ඇ) හෙද සේවයේ සියලුම නිලධාරින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට, රජයේ මුදල් රෙගුලාසිවලට, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද යටත් වනු ඇත.

(ඈ) අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිළිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යට කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඒ දෙනු ලබන පත්වීම් අවලංගු කර පුහුණුවෙන්/තනතුරෙන් පහ කරන අතර, නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ /ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියදම් හා ගිවිසුම්ගත මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී.

(ඊ) මෙම පුහුණු කාල සීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදු කළ බව අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු සිදු කරනු ඇත.

(උ) පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය නොවන යම් ගැටළු සහගත කරුණක් උද්ගත වුවහොත්, ඒ පිළිබඳව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල/දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

ජනක සුගතදස,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2017 ජූලි මස 28 වැනි දින,
සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

| | |
|---|---|
| දිස්ත්‍රික්කය | |
| උසස් පෙළ විෂය ධාරාව | |
| උසස් පෙළ සමත් වූ වර්ෂය | |
| මාධ්‍යය | |

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

***සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2017***

01. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

02. තැපැල් ලිපිනය (ඉංග්‍රීසියෙන්) :————.

03. (i) ස්ථිර ලිපිනය : (සිංහලෙන්)

| |
|---|
| |

(ii) දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්) [ ]

(iii) දුරකථන අංකය : ජංගම : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

ස්ථාවර : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

04. උපන් දිනය : වර්ෂය : 19 ————. මාසය :————. දිනය :————.

05. 2017.08.31 වැනි දිනට වයස : අවු. :————. මාස :————. දින :————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :

| | |
|---|---|
| පුරුෂ | |
| ස්ත්‍රී | |

අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.

07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

08. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

09. උස : (*අ*) අඩි :————. අඟල් :————. (*ආ*) සෙන්ටිමීටර් :————.

10. (*අ*) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

(1) වර්ෂය :————. විභාග අංකය :————.

Z - අගය :————. විෂය ධාරාව :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* | *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* |
|---|---|---|---|---|---|
| 1. | | | 3. | | |
| 2. | | | 4. | | |

(*ආ*) අ. පො. ස. (සා. පෙළ) විභාගය ඃ

*පළමු වාරය ඃ*

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* | *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* |
|---|---|---|---|---|---|
| 1. ගණිතය | | | 7. | | |
| 2. විද්‍යාව | | | 8. | | |
| 3. සිංහල | | | 9. | | |
| 4. ඉංග්‍රීසි | | | 10. | | |
| 5. | | | 11. | | |
| 6. | | | 12. | | |

*දෙවැනි වාරය ඃ*

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* | *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* |
|---|---|---|---|---|---|
| 1. | | | 7. | | |
| 2. | | | 8. | | |
| 3. | | | 9. | | |
| 4. | | | 10. | | |
| 5. | | | 11. | | |
| 6. | | | 12. | | |

11. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරු වී ඇත් ද?

'ඔව්' නම් විස්තර සපයන්න. :————.

12. *අයදුම්කරුගේ සහතිකය ඃ*

(*අ*) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(*ආ*) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව පසුව අනාවරණය වුවහොත් සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

| |
|---|
| රු. 300 *මුදල් ගෙවූ බැංකු ලදුපත මෙහි අලවන්න.* |

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* ෑ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................... මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ............ වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

__________,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ,
සම්පූර්ණ නම :__________.
තනතුර :__________.
ලිපිනය :__________.
දිනය :__________.

08-462

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2017 දෙසැම්බර් මස කොළඹදී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(*අ*) විභාග පටිපාටිය - කාර්යක්ෂතා කඩඉම් විභාගයේ විෂයයන් පහත දැක්වේ.

(i) විෂය අංක **01** - පාසල් පරිපාලනය හා අධීක්ෂණය, ලකුණු 100 - කාලය පැය 03
(ii) විෂය අංක **02** - පාසල් සැලසුම්කරණය, ලකුණු 100 - කාලය පැය 03
(iii) විෂය අංක **03** - අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර ෑ ලකුණු 100 - කාලය පැය 03

*විෂය නිර්දේශය* ෑ

(i) පාසල් පරිපාලනය හා අධීක්ෂණය-
පාසලක යහපාලනය සඳහා විදුහල්පතිවරයෙකුගේ කාර්යභාරය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කෙරේ. පාසල් කළමනාකරණ ක්‍රමවේද, කාලසටහන් සැකසීම, වගකීම් බෙදා දීම, පාසල් සංවර්ධනය සඳහා ජනතා සහභාගිත්වය, පාසල් පාදක කළමනාකරණය, පාසල් පාදක ගුරු සංවර්ධනය, ගුරු සුහසාධනය, ශිෂ්‍ය හිතකාමී පාසල් සංකල්පය, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ.

(ii) පාසල් සැලසුම්කරණය-
සංවර්ධනයේ නියමුවකු වශයෙන් විදුහල්පතිවරයෙකුගේ කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කරනු ලැබේ. පාසල් කළමනාකරණ මණ්ඩල, පාසලක දැක්ම හා මෙහෙවර, පාසල් තොරතුරු පාදක සැකසීම, සංයුක්ත සැලසුම්, දීර්ඝකාලීන හා කෙටි කාලීන සැලසුම්, වාර්ෂික ක්‍රියාත්මක සැලසුම්, පාසල් ජාල හා සම්පත් සැලසුම් කිරීම, ප්‍රාදේශීය සංවර්ධනයට පාසලේ දායකත්වය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ.

(iii) අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර-
ඉගෙනීම හා ඉගැන්වීම් පිළිබඳ නව සංකල්පය, අත්දැකීමෙන් ඉගෙනීම, තර්කානුකූල චින්තනය, අධ්‍යාපනයේ සමතාව, විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපන, වැඩිහිටි අධ්‍යාපනය, යාවජීව අධ්‍යාපනය, නිපුණතා පාදක අධ්‍යාපනය, ජීවත්වීම සඳහා අධ්‍යාපනය, ශිෂ්‍ය උපදේශන හා වෘත්තීයමය මාර්ගෝපදේශනය යන විෂය කරුණු පිළිබඳ දැනුම මැන බැලේ.

03. සාමාර්ථය ලැබීම සඳහා අපේක්ෂකයෙකු ඉල්ලුම් කරන එක් එක් විෂයයකට අවම වශයෙන් 40% ක හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

04. *විභාගයේ භාෂා මාධ්‍යය* :- සිංහල හා දෙමළ (ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

05. යම්කිසි අපේක්ෂකයෙකුට තමන්ට හිමිකමක් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.1 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. විභාගාපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

06.මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි.තවද , සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරන බව වැඩි දුරටත් සඳහන් කරමි.ඉල්ලුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

*ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-* ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

07.විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීතිරීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

08.ඉල්ලුම්පත් 2017 සැප්තැම්බර් මස 12 වැනි දින හෝ ඊට ප්‍රථම ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ'' ලිපිනයට ලැබෙන පරිදි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මඟින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමඟ ප්‍රවේශපත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

10. (i) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකු ම විභාගයේ පළමුවැනි දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) ඉහත 08 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

11. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා,

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගනු ලැබේ.

12. *විභාග ගාස්තු* :

(*අ*) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර, වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.

(*ආ*) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේ දී ගාස්තු අයකරනු නොලැබේ.

(ඇ) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දැක්වේ. :-

සම්පූර්ණ විභාගය සඳහා : රු. 500/-
එක් විෂයයක් සඳහා : රු. 250/-

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

13. විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

14. සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් පවතීනම් එහි දී සිංහල මාධ්‍යයෙන් වන නිවේදනය බලාත්මක වේ.

15. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රය

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017

Efficiency Bar Examination for officers in class 2 in Sri Lanka Principals Service -2017

(කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වමත්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය.)

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 2
දෙමළ - 3
☐

2. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA.) :——.

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා:- GUNAWARDHANA, H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3. ලිපිනය :
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරි :————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(iv) දුරකථන අංකය : (රාජකාරි)————.

4. (i) විදුහල්පති සේවයේ පන්තිය/ ශ්‍රේණිය :————.
(ii) පාසල / කාර්යාලය :————.
(iii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / කලාප අධ්‍යාපන කාර්යාලය

5. (i) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

(ii) උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(iii) ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
☐
(අදාළ අංකය කොටුව තුළ යොදන්න)

6. *ගැසට් නිවේදනයෙහි* 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය සහිතව අයදුම් කරනු ලබන විෂයයන් :

විෂය අංක 01- පාසල් පරිපාලනය හා අධීක්ෂණය ☐
විෂය අංක 02- පාසල් සැලසුම්කරණය ☐
විෂය අංක 03-අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර ☐

අදාළ විෂයය අංකය/අංක කොටුව/කොටු තුළ ලියන්න.

7. මීට ප්‍රථම අංක 1086/26 හා 1999.07.02 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව පැවති කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙහි පාසල් පරිපාලනය හා අධීක්ෂණය විෂයය සමත් නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 33/2014 පරිදි මෙම 2 වන කාර්යක්ෂමතා කඩඉමෙහි පාසල් පරිපාලනය හා අධීක්ෂණය විෂයය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. එම විෂයය සමත් නම් වසර, සමාර්ථය හා මාධ්‍යය ද සඳහන් කරන්න.

| *විෂයය* | *වසර* | *සාමාර්ථය* | *මාධ්‍යය* |
|---|---|---|---|
| පාසල් පරිපාලනය හා අධීක්ෂණය | | | |

8. *විභාග ගාස්තු* :

(i) ගෙවන ලද තැපැල්/උපතැපැල් කාර්යාලය :————.

(ii) ගෙවූ මුදල :————.

(iii) ගෙවූ දිනය :————.

(iv) ලදුපත් අංකය :————.

*ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය*

9. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10. විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා මගේ කොට්ඨාසයේ/ කලාපයේ/ පළාතේ නිලධාරියකු බව සහතික කරමි. තවද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බව ද / අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බවද සහතික කරමි.

————,
කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ/පළාත්
අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.

ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)
(අදාළ නොවන වචන කපා හරින්න)

08-436/1

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2017 දෙසැම්බර් මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ පළ කර ඇත.අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(*අ*) *විභාග පටිපාටිය* - කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් පහත දැක්වේ. :-

(i) විෂය අංකය 01- ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති.

ලකුණු 100 - කාලය පැය 02

(ii) විෂය අංකය 02 - පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි.
ලකුණු 100 - කාලය පැය 02

*විෂය නිර්දේශය* :

(i) ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති -ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, VIII, IX, X, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII යන පරිච්ඡේද හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

(ii) පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි -

අයවැය ඇස්තමේන්තු මුදල් පාලනය හා මුල්‍ය වගකීම් පැවරීම,මුදල් භාර ගැනීම ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය, ගෙවීම්,රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, වැඩ හා සේවා, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිත වන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම්, නොගෙවූ වේතන, රාජකාරි දුරකථන පිළිබඳව නිකුත් කර ඇති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

03. සාමාර්ථය ලැබීම සඳහා අපේක්ෂකයකු ඉල්ලුම් කරන එක් එක් විෂයයකට අවම වශයෙන් 40% ක හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

04. *විභාගයේ භාෂා මාධ්‍යය* :- සිංහල හා දෙමළ (ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

05. යම්කිසි අපේක්ෂකයකුට තමන්ට හිමිකමක් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.1 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. විභාගාපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

06. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තු වලට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි.තවද , සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරන බව වැඩි දුරටත් සඳහන් කරමි.ඉල්ලුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

(*ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* .- ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.)

07.විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

08.ඉල්ලුම්පත් 2017 සැප්තැම්බර් මස 12 වැනි දින හෝ ඊට ප්‍රථම ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503,කොළඹ'' ලිපිනයට ලැබෙන පරිදි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමඟ ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10. (i) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතුයි. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාගයේ පළමුවැනි දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුයි.තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) ඉහත 08 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

11.විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා,

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගනු ලැබේ.

12. විභාග ගාස්තු :

(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර

වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ.

(*ආ*) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේ දී ගාස්තු අයකරනු නොලැබේ.

(*ඇ*) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දැක්වේ.

සම්පූර්ණ විභාගය සඳහා : රු. 500/-
එක් විෂයයක් සඳහා : රු. 250/-

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරග නු නොලැබේ.

13. විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කලහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

14. සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම් එහිදී සිංහල මාධ්‍යයෙන් වන නිවේදනය බලාත්මක වේ.

15.මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2017,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ ඉල්ලුම්පත්‍රය**

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017**

Efficiency Bar Examination for officers in class, 3 in Sri Lanka Principals Service - 2017

(කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව,ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ. වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වමත්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය.)

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල -2
දෙමළ - 3 ☐

2. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(*උදා* :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA.) :———.

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(*උදා*:- GUNAWARDHANA, H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3. ලිපිනය :
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරි :————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(iv) දුරකථන අංකය : (රාජකාරි)————.

4. (i) විදුහල්පති සේවයේ පන්තිය/ ශ්‍රේණිය :————.
(ii) පාසල / කාර්යාලය :————.
(iii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / කලාප අධ්‍යාපන කාර්යාලය :————.

5. (i) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

(ii) උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(iii) ස්ත්‍රී/පුරුෂ භාවය:
පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

6. *ගැසට් නිවේදනයෙහි* 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය සහිතව අයදුම් කරනු ලබන විෂයයන් :-

විෂයය අංකය 01- ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති - ☐
විෂයය අංකය 02 - පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි ☐

අදාළ විෂයය අංකය/අංක කොටුව/ කොටු තුළ ලියන්න.

7. විභාග ගාස්තු :-

(i) ගෙවන ලද තැපැල්/උපතැපල් කාර්යාලය :- ............

(ii) ගෙවූ මුදල :- .................. (iii) ගෙවූ දිනය :-........

(iv) ලදුපත් අංකයඃ- ................................

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය |

8. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

9. විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා මගේ කොට්ඨාසයේ/ කලාපයේ/පළාතේ නිලධාරියෙකු බව සහතික කරමි. තව ද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බව ද / අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

————,
කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන
අධ්‍යක්ෂගේ/ අතිරේක පළාත්
අධ්‍යාපන අධ්‍යක්ෂගේ/පළාත් අධ්‍යාපන
අධ්‍යක්ෂගේ අත්සන.

ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)
(අදාළ නොවන වචන කපා හරින්න).

08-436/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.